# සාංඛ්‍ය - යෝග සහ බෞද්ධ දර්ශනාගත විමුක්ති මාර්ගයන්හි සමාන්තරතා

නවගමුවේ රේවත හිමි

'යෝගය' අධ්‍යාත්මාභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය සාධනයක් බව හින්දු බෞද්ධ යන දර්ශනද්වයෙහි ම පිළිගැනෙයි. පතඤ්ජලීන්ගේ යෝග දර්ශනය සාංඛ්‍ය දර්ශනයෙහි එන පාරභෞතික සිද්ධාන්ත එලෙස ම පිළිගන්නා අතර අධ්‍යාත්ම සාධනය සඳහා ප්‍රායෝගික මාර්ගයක් හැටියට යෝගයට මුල් තැනක් දෙයි. පාතඤ්ජල දර්ශනයට අනුව යෝගය යනු චිත්ත වෘත්ති නිරෝධයයි.[1] සාංඛ්‍ය - යෝග දර්ශනයට අනු ව චිත්තය භෞතික පදාර්ථයකි. එය ද්‍රව්‍යාත්මක ය. සත්ව රජස් හා තමස් යන ගුණයන්ගෙන් සිත හැඩී ඇත.[2] සිත පිළිබඳ වූ රාජස හා තාමස වෘත්තීන් වැළැක්වීම යෝගය වෙයි.[3]

සාංඛ්‍ය දර්ශනයට අනුව විශ්වය පරිණාමය වීමට මූල හේතු දෙකකි. ප්‍රකෘති හා පුරුෂ ඒ දෙක යි. පුරුෂ විශ්වය පිළිබඳව විඥානමය මූල හේතුව යි. 'ප්‍රකෘති' ද්‍රව්‍යාත්මක හේතුව යි. සත්ව රජස් හා තමස් යන ගුණයන්ගෙන් ප්‍රකෘති හැඩී ඇත.[4] සත්ව ගුණය දීප්තිමත් ය. ශ්වේත වර්ණයට සමාන කළ හැකි ය. බුද්ධිය, අවබෝධය, විරාගය, සතොස දානය, ඓශ්වර්යය වැනි ප්‍රසාදනීය සත්ව ගුණය නිසා ලැබේ. සියලු ඌර්ධ්වගාමී ක්‍රියා සත්ව ගුණය නිසා ඇතිවෙයි. රජෝ ගුණය රාගය, ආදරය, වෛරය, ක්‍රෝධය, යනාදී භාවයන් ඇති කරයි. සියලු තිර්යග්ගාමී ක්‍රියා රජෝ ගුණයෙන් සිදු වේ. 'තමෝ' ගුණය අලසකම, අනවබෝධය, ප්‍රමාදය, මරණය, ජඩත්වය, මෝහය ආදිය ඇති කරයි.[5] සිතෙහි විවිධත් විට ඒ ඒ ගුණයන් ප්‍රධානත්වය ලබන විට එහි ස්වරූපය වෙනස් වෙයි. සිත පිළිබඳ ව රාජස හා තාමස වෘත්තීන් නිරෝධයට පත් වූ විට, පවිත්‍ර වූ සත්ව ගුණය අධික ව පවත්නා විට සිත ඒකාග්‍ර වේ. යෝගයට යොමු වේ. මේ නිසා යෝගයෙහි පරමාර්ථය වනී රාජස හා තාමස වෘත්තීන්